ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
විද්‍යාව පිළිබඳ පදනම් පාඨමාලාව
සංවෘත පොත් පරීක්ෂණය (CBT) - 2007/2008
MAF 1302/MAE 1302 - ව්‍යවහාරික ගණිතය

කාලය :- පැය 1 ½ යි.

දිනය :- 30-10-2007. වේලාව:- ප.ව. 1.30 සිට ප.ව. 3.00 දක්වා

ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.

01. තිරසට $\theta$ කෝණයකින් ආනත සුමට තලයක් මත ස්කන්ධය 5kg වූ $P$ අංශුවක් තබා ඇත. මෙම අංශුවට ආනත තලයේ වැඩිතම බෑවුම් රේඛාව ඔස්සේ සිටින පරිදි අවිතන්‍ය තන්තුවක් මගින් ස්කන්ධය 4kg වූ $Q$ අංශුවකට සම්බන්ධකොට තලයේ වූ සුමට නාදැත්තක් හරහා දමා ඇත්තේ $Q$ අංශුව තිරස් තලයේ සිට 2m ඉහළින් එල්ලෙමින් සිටින පරිදිය. පද්ධතිය දැන් නිශ්චලතාවයෙන් මුදා හරිනු ලැබේ. $P$ අංශුව නාදැත්ත ළඟට නොපැමිණේ යයි සිතා, (මෙහි $\sin\theta = \frac{3}{5}$.)

(a) $Q$ හි ආරම්භක ත්වරණයත්

(b) $Q$ අංශුව තිරස් තලයට ළඟාවීමට ගතවන කාලයත්

(c) $P$ අංශුව තලය ඉහළට ගමන් කරන මුලු දුරත් සොයන්න.

02. මෙම රූපයේ දැක්වෙන පරිදි මුහුදු මට්ටමට 49m ඉහළින් පිහිටි අටල්ලක $T$ නම් ස්ථානයක සිට තිරසට 45° කෝණයකින් ආනතව 14ms$^{-1}$ ප්‍රවේගයෙන් ගොල්ෆ් බෝලයක් ප්‍රක්ෂේපණය කරනු ලැබේ. $T$ ලක්ෂ්‍යට සිරස්ව පහළින් $O$ පිහිටා ඇත. $A$ යනු බෝලයේ චලිතයේදී සිරස්ව ගමන් කලහැකි උපරිම උසවේ. $B$ ලක්ෂයේ දී බෝලය මුහුද මත වදී නම්,




(a) මුහුදු මට්ටමේ සිට $A$ ට ඇති උස සොයන්න.

(b) $OB$ දුර සොයන්න.

03.(i) $XYZW$ තල චතුරස්‍රයේ විකර්ණ $O$ හිදී ඡේදනය වේ. $A$ හා $B$ යනු පිළිවෙලින් $XZ$ හා $YZ$ පාදවල මධ්‍ය ලක්ෂ්‍ය වේ.

(a) $\frac{1}{2}\left(\overrightarrow{YX}+\overrightarrow{YZ}\right)=\overrightarrow{YA}$ (b) $\overrightarrow{YX}+\overrightarrow{YZ}+\overrightarrow{WX}+\overrightarrow{WZ}=4\overrightarrow{BA}$ බව පෙන්වන්න.

(ii) $\underline{a}=2\underline{i}-\underline{j}+\underline{k}$ හා $\underline{b}=\underline{i}-\underline{j}+\underline{k}$ නම් $\underline{a}\cdot\underline{b}$ අගයන්න. එනයින් $\underline{a}$ හා $\underline{b}$ අතර සුළු කෝණය සොයන්න.